# 11 ශ්‍රේණිය සිංහල

## 02 ඒකකය - 2022

# දුකට කියණ කවි සීපද



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

11 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 02. දුකට කියන කවි සීපද



රමණීය හැඟීම් ගැබ් වුණු රචනාවක් සාහිත්‍ය නිර්මාණයක් සේ හඳුන්වනු ලැබේ. මේ කවි පෙළට වස්තු වී ඇත්තේ ගැමි සමාජයක හට ගැනුණ නෑනා - මස්සිනා ප්‍රේම සම්බන්ධයකි. මේ කවි පෙළ ලියවී ඇත්තේ එළිසම සිවු පද ආකෘතියෙනි. මාත්‍රා 17, 18, 19 ආදි ප්‍රමාණවලින් යුතු පද්‍ය එහි ඇතුළත් වී තිබේ.

## අරුත් පැහැදිලි කිරීම

- අස්වන් - අස් වැදුණු දේ, පීදුණු දේ, හටගත් දේ, අස්වැන්න
- උලලේනා - කැලෑබදව වෙසෙන, නිශාචර පක්ෂියෙකි; උලමා, උලලේනා, උලලිහිණියා, උලලේනි යනුවෙන් ද නම් කෙරේ. උලලේනාගේ හඬ අප්‍රිය ජනක සේ සැලකීම ගැමි විශ්වාසයකි. ගැමියන්ගේ මතය එය මරණයක පෙර නිමිත්තක් බව යි.
- ඔපනැලි - ඇඳුමේ යොදන රැල්ල; ඇඳුම් හැඩ වැඩ දමා අලංකාර කර ගැනීමට යොදා ගන්නා රැලි මාලාවකි. කාන්තා ඇඳුම් සඳහා අලංකාරයක් ලෙස ද ඔපනැලි යොදා ගැනේ.
- තිස්පැය - දිනකින් අර්ධයක්; (සිංහල කාල ගණන් ක්‍රමය අනුව දිනකට පැය හැටකි. වර්තමාන ව්‍යවහාර පැයක කාලයක් සඳහා සිංහල පැය දෙකහමාරක් ඇතුළත් ය.) රෑ තිස් පැය යනු රැයක් පහන් වන තුරු කාලයයි.
- දෙගොඩහරිය - මධ්‍යම රාත්‍රිය දෙපැත්තට ම සමව තිබෙන වේලාව.
- පිළ - ගෙයක තනා ඇති මිටි පටු වේදිකාව, හිඳ ගැනීම හා නිදා ගැනීම සඳහා තැනූ මිටි බිත්තිය. පුරාණ නිවෙස්වල මෙවැනි පිළක් තැනීම ද ඒ මත පැදුරක් අතුරා තිබීම ද දක්නට ලැබිණි.

- **පෙති ගෝමර** - ගෝමර යනු ශරීරයේ හට ගන්නා කැලැල් විශේෂයකි. මෙය පුස් (දිලීර) හේතුවෙන් හට ගන්නා චර්ම රෝගයකි. එහෙත් ගෝමර හටගත් ස්ත්‍රී ශරීරයේ ශෝභාවක් ඇතැයි කවියෝ පවසති. එය කවියාගේ සම්මතය යි.
- **මදු මල්** - ගිරිතිල්ල කුලයේ වැල් විශේෂයක හටගන්නා මල්; ජන කවියා නිතර දුටු මල් වර්ගය මෙය බව පෙනේ.
- **මැස්ස** - ලී කෝටු සම උසකින් රටාවකට අනුව තබා හරහට බැඳ නිදා ගැනීමට හැකි වන ලෙස පැලක තනා ගන්නා ඇඳ; ලී තට්ටුව, අට්ටාලය යන අර්ථ ද දෙයි.
- **සේලය** - ඉණට අඳින ප්‍රමාණයෙන් දිග රෙද්ද.

**අවබෝධය**

1. කවියාගේ සිතට දුක දැනෙන්නේ කුමක් නිසා ද?
2. නෑනා පිළිබඳව මතකයට නංවන සිද්ධි ලෙස කවියා දක්වා ඇත්තේ මොනවා ද?
3. 'ළමා ළපටි නෑනා' යන යෙදුමෙන් ධ්වනිත වන්නේ කුමක් ද?
4. මෙහි කථකයා සහ ඔහුගේ නෑනා අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවිතය ගත කළ බව ප්‍රකාශ වන පද්‍යය කුමක් ද?
5. නෑනාගේ කෙළි ලොල් ජීවිතය පිළිබඳව හැඟීම් ඉස්මතු කර දක්වන පද්‍ය පාඨයක් උපුටා දක්වන්න.

**අවබෝධය - පිළිතුරු**

1. නෑනා පැදුරේ රටා වියපු අත් දෙක සිහිවෙන නිසා.
2. පැදුරේ රටා වියපු අත් දෙක සිහිවීම, එගොඩ ගොඩේ උල ලේනා අඬන විට, සීතල දැනෙන විට, මදු මල් පිපෙනවා දකින විට, ගිරවු එන විට.
3. නෑනා ළාබාල තැනැත්තියක් බව.
4. උඹයි මායි අපි දෙන්නා එකතු වෙලා
   කැලේ කපා වල් කොටලා ගිනි තියලා
   වැවු කුරක්කන් ගොබ දැන් කළු ගැහිලා
   මෝරයි බංඩි මඳ සුළඟට නැමීලා
5. බුලත් හපා හප සුළඟට පිඹින නගේ

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් එක් එක් යෙදුමට සමාන යෙදුම පද්‍ය පන්තියෙන් උපුටා ලියන්න.**

   i. ළාබාල -
   ii. නිදා ගන්නවා -
   iii. මැදියම අවසන් වී -
   iv. සීතල ඇති ජනවාරියේ -
   v. සීතල දරා ගන්න -
   vi. රැය පහන් වන තුරු -
   vii. නින්ද යන්නේ -
   viii. සුළඟට සෙලවෙන -

2. **පහත ඉදිරිපත් කර ඇති එක් එක් යෙදුමේ ව්‍යංග්‍යාර්ථ ලියා දක්වන්න.**

   i. රටා වියපු අත් දෙක මට සිහි වෙනවා -
   ii. ඇඹූ කඳුළු මුහුදට එක් වුණා දෝ -
   iii. සිවු පද කියන මම තනියම පැලේයා -
   iv. පැලේ ගින්න විතරයි තනියට ඇත්තේ -
   v. අනේ ගිරවුනේ මා බස අසාපන් -

**1.**

**I. ළපටි**
**II. සැතපෙනවා**
**III. දෙගොඩ හරිය ගෙවිලා**
**IV. සීත කරන උඳුවප් මහ දුරුත්තේ**
**V. සීතල උහුලන්ඩ**
**VI. රෑ තිස් පැයේ**
**VII. ඇස පියෙන්නේ**
**VIII. සුළඟට නටන**

**2.**

**I. නෑනාව සිහිවන බව**
**II. නෑනා නැතිව ඉතා දුකින් කාලයක් සිටි බව**
**III. කවියා තවම තනිකඩ බව**
**IV. නෑනාට පැළට එන්නට ආරාධනා කිරීම**
**V. නෑනාට කවියාගේ සිතිවිලි නොදැනෙන බව**

vi. හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ -
vii. කුරහන් පැහී මොකට ද උඹ නැති දාට -
viii. කුරහන් කපන්නට හේනට වඩින් නගේ -

3. පහත සඳහන් එක් එක් යෙදුම් සඳහා පද්‍ය පන්තියේ ඇතුළත්ව තිබූ ජනවහර ඉදිරිපත් කරන්න.

i. රටා විය්‍යූ -
ii. එවිට -
iii. මැදියම -
iv. නොමැත -
v. නො හැකි ය -
vi. ඔබගේ මුවින් -
vii. ඇතින් -
viii. නැඟණියෝ -
ix. සොයන්න -
x. නිදිවර්ජිතව -

VI. නෑනාව නිතරම සිහිපත් වන බව
VII. කුමන සම්පත් තිබුණත් නෑනා නොමැතිව සතුටක් නැති බව
VIII. ඉක්මණින්ම නෑනාව හිමි වීමට ප්‍රාර්ථනා කිරීම

3.

I. රටා වියපු
II. එතකොට
III. දෙගොඩ හරිය
IV. නැතේයා
V. බැරුවා
VI. උඹේ කටින්
VII. එපිටින්
VIII. නඟා
IX. සොයාපන්
X. නිදි මරන්නේ



## ප්‍රායෝගික අභ්‍යාස

1. පන්තිය කණ්ඩායම් වශයෙන් සකස් වී පද්‍ය පන්තිය ආශ්‍රිතව පහත දක්වා ඇති ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්න. අවශ්‍ය විට දී ගුරු සහාය ලබා ගන්න.

   1 කණ්ඩායම
   පද්‍ය පන්තියේ අන්තර්ගතය පැහැදිලි කරන්න.

   2 කණ්ඩායම

   පද්‍ය පන්තියේ ඇතුළත් ශබ්ද රසය උදාහරණ සහිතව විස්තර කරන්න.

   3 කණ්ඩායම

   පද්‍ය පන්තියේ අර්ථ රසය පිළිබඳ කෙටි සාකච්ඡාවක් පවත්වන්න.

   4 කණ්ඩායම

   පද්‍ය නිර්මාණය රස විඳිමින් කෙටි විචාරයක් ඉදිරිපත් කරන්න.

   5 කණ්ඩායම

   ගුරු සහාය ලබා ගෙන ඉහත ඉදිරිපත් කිරීම්වල ඌන පූරණය, ඇගයීම, සමාලෝචනය සිදු කර, අවසන ස්තුතිය පුද කරන්න.

## ගුරු උපදෙස්

- මහගම සේකරයන්ගේ 'දුකට කියන කවි සීපද' (පිළේ පැදුර) පද්‍ය නිර්මාණය සුදුසු ක්‍රමවේදයක් මගින් සවන් දෙන්න. ගායනය කරන්න.
- සවන් දීමේ දී හා ගායනයේ දී ඇති වූ හැඟීම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- කවි පෙළෙහි අන්තර්ගත පහත සඳහන් ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.

➢ <u>ශබ්ද රසය</u> - ශබ්දය අනුව ඇති වන ප්‍රියජනක හැඟුම නිසා දැනෙන ආස්වාදය. රිද්මය, එළිසමය, වචන, අකුරු යන අංග ශබ්ද රසයට හේතු වේ. කනට විෂය වේ.

➢ <u>අර්ථ රසය</u> - කවියෙහි අර්ථය අවබෝධ වූ විට රසවත් බවක් ජනිත වේ. එය අර්ථ රසයයි. කාව්‍යෝක්ති, අලංකාර, නව නළු රස අර්ථ රසය තීව්‍ර කරයි. උපමා, රූපක, ගැමි වදන්, සරල බව, ජනකවි ලක්ෂණ යන අංග අර්ථ රසයට හේතු වේ. මනසට විෂය වේ.

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | 02 ඒකකය |
|---|---|---|

## දුකට කියන කවි සීපද

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1). මෙම කවි පෙළ සඳහා වස්තුවිෂය වී ඇත්තේ කුමක් ද?

❖ ...............................................................................................

...............................................................................................

(2). මෙහි කවියාගේ සිතට දුකක් දැනෙන්නේ කුමක් නිසා ද?

❖ ...............................................................................................

...............................................................................................

(3). පද්‍යයේ යෙදුණු ව්‍යංගයාර්ථවත් කවිපද පේළි උපුටා දක්වන්න.

...............................................................................................

...............................................................................................

...............................................................................................

(4). නෑනා පිළිබඳව මතකයට නංවන සිද්ධි ලෙස කවියා දක්වා ඇත්තේ මොනවා ද?

...............................................................................................

...............................................................................................

...............................................................................................

(5). කවියාගේ එකම සැනසුම නෑනා බව කියවෙන කවිපද උපුටා දක්වන්න.

...............................................................................................

...............................................................................................

...............................................................................................

02. පහත පදවල අරුත් පැහැදිලි කරන්න.

(1). සේලය - ...............................................................................

...............................................................................

(2). අස්වන් - ...............................................................................

...............................................................................

(3). ඔපනැලි - ...............................................................................

...............................................................................

(4). උලලේනා - ...............................................................................

...............................................................................

(5). තිස්පැය - ...............................................................................

...............................................................................

(6). දෙගොඩහරිය - ..........................................................................................

..........................................................................................

(7). පිළ - ..........................................................................................

..........................................................................................

(8). පෙතිගෝමර - ..........................................................................................

..........................................................................................

(9). මැස්ස - ..........................................................................................

..........................................................................................

(10). මදු මල් - ..........................................................................................

..........................................................................................

03. පහත දැක්වෙන යෙදුම්වලට ගැළපෙන ජනවහර ඉදිරිපත් කරන්න.

(1). නිදිවර්ජිතව - ..........................................................................................

(2). රටා වියූ - ..........................................................................................

(3). නැගණියෝ - ..........................................................................................

(4). නිදියනවා - ..........................................................................................

(5). අග්නි - ..........................................................................................

(6). විකසිත - ..........................................................................................

(7). නො හැකිය - ..........................................................................................

(8). කැළය - ..........................................................................................

(9). අළුයම - ..........................................................................................

(10). රාත්‍රිය - ..........................................................................................

04. පහත දැක්වෙන කවිපදවල අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

(1). ''රටා වියපු අත් දෙක මට සිහිවෙනවා''

..........................................................................................

(2). ''සීතල උහුලන්ඩ මට බැරුවා සත්තේ''

..........................................................................................

(3). ''වැවු කුරක්කන් ගොබ දූන් කලු ගැහිලා''

..........................................................................................

(4). ''පාන්දරට යන්තම් ඇස පියෙන්නේ''

..........................................................................................

(5). ''ඉපනැලි යටින් පෙතිගෝමර ඉහන නගේ''

..........................................................................................

*සැකසුම:- චමින්ද ගුණරත්න මයා*

# පිළිතුරු



**Answer**

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA COLOMBO 10

**ඒකක පරීක්ෂණය**

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | 02 ඒකකය |
|---|---|---|

## දුකට කියන කවි සීපද

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1). මෙම කවි පෙළ සඳහා වස්තුවිෂය වී ඇත්තේ කුමක් ද?

❖ ගැමි සමාජයක හට ගැනුණු නෑනා මස්සිනා ප්‍රේම සම්බන්ධයකි.

(2). මෙහි කවියාගේ සිතට දුකක් දැනෙන්නේ කුමක් නිසා ද?

❖ නෑනා පැදුරේ රටා වියපු අත් දෙක සිහිවෙන නිසා.

(3). පද්‍යයේ යෙදුණු ව්‍යංගයාර්ථවත් කවිපද පේළි උපුටා දක්වන්න.

රටා වියපු අත් දෙක මට සිහි වෙනවා
ඇඬූ කඳුළු මුහුදට එක් වුණා දෝ
සිවු පද කියන මම තනියම පැළේයා

(4). නෑනා පිළිබඳව මතකයට නංවන සිද්ධි ලෙස කවියා දක්වා ඇත්තේ මොනවා ද?

පැදුරේ රටා වියපු අත් දෙක සිහිවීම.
සීතල දැනෙන විට, මදු මල් පිපෙනවා දකින විට,
හේනට ගිරවු එන විට.

(5). කවියාගේ එකම සැනසුම නෑනා බව කියවෙන කවිපද උපුටා දක්වන්න.

කුරහන් පැහී මොකට ද උඹ නැති දාට
හීනෙන් ඇවිත් නෑනා අත වනන්නේ
ළමා ළපටි නෑනා කොයි ගියාදෝ

02. පහත පදවල අරුත් පැහැදිලි කරන්න.

(1). සේලය - ඉණට අඳින ප්‍රමාණයෙන් දිග රෙද්ද

(2). අස්වන් - අස් වැදුණු දේ, පිදුණු දේ, හටගත් දේ, අස්වැන්න

(3). ඔපනැලි - ඇඳුමේ යොදන රැල්ල කාන්තා ඇඳුම් සඳහා අලංකාරයක් ලෙස ද ඔපනැලි යොදා ගැනේ.

(4). උලලේනා - කැලෑබඳව වෙසෙන, නිශාචර පක්ෂියෙකි. උලලේනාගේ හඬ මරණයක පෙර නිමිත්තකි.

(5). තිස්පැය - දිනකින් අර්ධයක් රැයක් පහන් වන තුරු කාලයයි.

(6). දෙගොඩහරිය - මධ්‍යම රාත්‍රිය
දෙපැත්තට ම සමව තිබෙන වේලාව.

(7). පිළ - ගෙයක තනා ඇති මිටි පටු වේදිකාව, හිඳ
ගැනීමට හා නිදා ගැනීමට තැනූ මිටි බිත්තිය.

(8). පෙතිගෝමර - ගෝමර යනු ශරීරයේ හට ගන්නා කැලැල්
විශේෂයකි. දිලිර නිසා ඇතිවන චර්ම රෝගයකි.

(9). මැස්ස - ලී කෝටු රටාවකට අනුව තබා හරහට බැඳ
නිදා ගැනීමට සෑදූ ඇඳ ලී තට්ටුව, අට්ටාලය.

(10). මදු මල් - ගිරිතිල්ල කුලයේ වැල් විශේෂයක හටගන්නා
මල්. ජන කවියා නිතර දුටු මල් වර්ගයකි.

03. පහත දැක්වෙන යෙදුම්වලට ගැළපෙන ජනවහර ඉදිරිපත් කරන්න.

(1). නිදිවර්ජිතව - නිදි මරන්නේ
(2). රටා වියූ - රටා වියපු
(3). නැගණියෝ - නගා
(4). නිදියනවා - ඇස පියෙන්නේ
(5). අග්නි - ගින්න
(6). විකසිත - පිපෙනවා
(7). නො හැකිය - බැරුවා
(8). කැළය - කැලේ
(9). අළුයම - පාන්දර
(10). රාත්‍රිය - රෑ

04. පහත දැක්වෙන කවිපදවල අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

(1). ''රටා වියපු අත් දෙක මට සිහිවෙනවා''
පැදුරේ රටා වියූ නෑනාව සිහිවෙයි.

(2). ''සීතල උහුලන්ඩ මට බැරුවා සත්තේ''
දැඩි සීතල දරා ගත නොහැකි ය.

(3). ''වැවු කුරක්කන් ගොබ දූන් කලු ගැහිලා''
කුරක්කන් පීදී අස්වැන්න නෙළා ගැනීමට ළංව ඇත.

(4). ''පාන්දරට යන්තම් ඇස පියෙන්නේ''
පාන්දර යාන්තමින් නින්දට යයි

(5). ''ඉපනැලි යටින් පෙතිගෝමර ඉහන නගේ''
ඇඳුමේ රැලි අතරින් ස්ත්‍රී ශරීරයේ ශෝභාව පෙනයි.

*සැකසුම:- චමින්ද ගුණරත්න මයා*

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තුතියි !

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3in1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ